Year 2004

### එතෙර පදිංචියට යන්නවුන් සඳහා සේවා රැසක්

# කැරියර් ඩිවලොප්මන්ට් සෙන්ටර් වෙතින්

2004 අගෝස්තු මස 03 වැනිදා අඟහරුවාදා

විදේශ ගතවීමට අදහස් කරන විවිධ වෘත්තිකයන් සඳහා ආගමන විගමන උපදෙස් සේවාවන් ලබාදෙන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනයක් ලෙස කැරියර් ඩිවලොප්මන්ට් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ් (Career Development Center (Pvt) ltd) සැලකේ. 1997 වසරේ පිහිටවූ මෙම ආයතනය ආරම්භයේ සිට මේ දක්වා වෘත්තීයමය සුදුසුකම් ලත් දහස් ගණනකට යුරෝපා රටවල පදිංචිවීමට අවශ්‍ය වීසා ලබාගැනීම සඳහාවන උපදේශන සේවා සපයා ඇත. ඊට අමතරව මෙවන් වෘත්තිකයන් වෙනුවෙන් තවත් සේවාවන් රැසක් කැරියර් ඩිවලොප්මන්ට් සෙන්ටර් පුද්ගලික සමාගම විසින් ලබාදී ඇත.

මෙම සමාගම වෙත පැමිණෙන සේවාදයකයන් වෙත ලැබෙන සේවාවන් හා ප්‍රතිලාභ රැසකි. ඒ අතර ප්‍රධාන ස්ථානයක් ගනු ලබන්නේ යුරෝපීය රටවල පවතින ආගමන විගමන නීතිරීතින්වලට අදළ නියමිත සුදුසුකම් ඇති අය පමණක් නිවැරදිව තෝරා ගැනීම සහ ඔවුන්ගේ සියලුම ආගමන විගමන කටයුතුවලට අදළව තානාපති කාර්යාල සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම බව කැරියර් ඩිවලොප්මන්ට් සේනටර් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා මෙන්ම ජ්‍යෙෂ්ඨ උපදේශිකා යුනි සමන්තිකා පතිරගේ මහත්මිය 'දිවයින' සමග පැවැත්වූ සාකච්ඡාවේදී පැවැසුවාය.

ඉහත සේවාවන්ට අමතරව වීසා සඳහා සුදුසුකම් ලබන්නවුන් සඳහා එතෙර රැකියා අවස්ථා සලසාදීම, නවාතැන් පහසුකම් සහ දරුවන් සඳහා අධ්‍යාපනික පහසුකම් සලසාදීම ආදියද තම සමාගමෙන් ඉටුකර දෙන බව පතිරගේ මහත්මිය වැඩිදුරටත් පැවසුවාය.

කැරියර් ඩිවලොප්මන්ට් සෙන්ටර් පුද්ගලික සමාගම සිය නවතම හඳුන්වාදීම පසුගියද සිදු කරන ලදී. ඒ ඔවුන්ගේ වෙබ් අඩවිය විවෘත කිරීමයි. www.cdclanka.com ලිපිනය දරන වෙබ් අඩවිය සමගින් මෙතෙක් ශ්‍රී ලංකාවේ ආගමන විගමන උපදේශන සේවාවක් විසින් හඳුන්වා දුන් ප්‍රථම වෙබ් අඩවිය හිමිකර ගනිමින් වාර්තාවක්ද තැබීමට



**යුනි සමන්තිකා පතිරගේ**
**කළමනාකාර අධ්‍යක්ෂිකා**
**කැරියර් ඩිවලොප්මන්ට් සේනටර්**
**පුද්ගලික සමාගම**

කැරියර් ඩිවලොප්මන්ට් සෙන්ටර් සමාගම සමත්වී ඇත.සුදුසුකම් ලත් වෘත්තිකයන් නවසීලන්තය, කැනඩාව, ඔස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය වැනි යුරෝපීය රටවලට යොමු කිරීමත් ඔවුන්ට රැකියා සොයාදීම, නවාතැන් පහසුකම් මෙන්ම ළමුන්ට පාසල් සොයාදීමත් කැරියර් ඩිවලොප්මන්ට් සෙන්ටර් අරමුණු වුවද විදේශ රැකියා ලබාදීම සිය ප්‍රධාන අරමුණ නොවන බව සමන්තිකා පතිරගේ මහතමිය වැඩිදුරටත් සඳහන් කළාය.

මේ දිනවල ඔස්ට්‍රේලියාව සඳහා හඳුන්වාදී තිබෙන නවතම වීසා කාණ්ඩය වන Skcilled Indipendent negunal visa සඳහා අයදුම්පත් කැඳවන බවද ඒ සඳහා වන මූලික වටයේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන බවද කී ඇය මෙකී අයදුම්කරුවන් සඳහා අංග සම්පූර්ණ ඉංග්‍රීසි පාඨමාලා (International English Knowledge Testing System) නුගේගොඩ පිහිටි ආසියානු හෝටල් පාසලේ ආරම්භ කෙරෙන බවද පැවසුවාය.

*ස්වර්ණා විජේකෝන්*